# නිර්වර්ණ සහ කටු ඔටුණු උපේක්ෂා සේනානායක

## දිරිය කතුන් දෙදෙනකුගේ ආගමනය




ජගත් ජේ එදිරිසිංහ

ලේඛකයකුගේ සිතට වැද ගන්නා වස්තු බීජයක් පියවරෙන් පියවර හැඩ ගැන් වී වර්ධනය වී වදන් බවට පෙරළී කල් යල් බලා එළි දැක්වීම ජීවියකු ලොවට පහළ වන්නා සේම ආශාවාදජනක අත්දැකීමකි. ඒ ආශ්වාදය ලේඛකයා හෝ ලේඛිකාවට හෝ පමණක් සීමා නොවෙයි. එය පාඨකයාටත් නව අත්දැකීමක් ගෙනදෙයි.

උපේක්ෂා සේනානායක තරුණ ලේඛිකාවගේ කුළුඳුල් මුද්‍රිත ග්‍රන්ථය "නිර්වර්ණ සහ කටු ඔටුණු" නමින් දැන් නිකුත් වී තිබීම අපේ සතුටට හේතුවන කරුණකි. තමා හැකියා පූර්ණ ලේඛිකාවක බව උපේක්ෂා සිය පුවත්පත් ලේඛණ ඔස්සේ මෙයට පෙර අපට පෙන්වා දී ඇතත් නිර්මාණකාරියක ලෙස මෙලෙස අප ඇය අත්විඳින්නේ පළමු වතාවටය. එනිසාම ඇගේ නිර්මාණය පිළිබඳ අපේ රසවින්දනය මෙසේ සටහන් කර තබන්නට අපි කැමැත්තෙමු.

"නිර්වර්ණ සහ කටු ඔටුණු" කෙටි නවකතා දෙකකින් සමන්විත ය. නවකතා ද්විත්වය ගෙතී ඇත්තේ කාන්තා චරිත දෙකක් වටා ය. නිර්වර්ණ නවකතාවේ කතා නායිකාව අභීත ලේඛිකාවක වන විට කටු ඔටුණු නවකතාවේ කතා නායිකාව ව්‍යවසායිකාවක වෙයි.

කටු ඔටුණු නවකතාවේ කතා නායිකාව නිර්මලා ඒකනායකයි. ඇය ඉහළ ආර්ථික ශක්තියක් ඇති පුවත්පත් ලේඛිකාවකි. ඇගේ සැමියා ආචාර්ය සොහාන් ඒකනායක නාට්‍යවේදියකුව සිටි විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයෙකි. කතාව ඇරඹෙද්දීම මේ දෙදෙනා සිටින්නේ විවාහය බිඳ වැටී දෙපසකය. නිර්මලා අද කාලයේ දක්නට විරල කුලකයක් වන "අභීත ලේඛකයා" යන ගණයට වැටෙන ලේඛිකාවකි. අද කාලයේ ලේඛක ලේඛිකාවන් සියල්ලන්ම පාහේ නිවට ලෙස බලය හමුවේ කොඳු ඇට කඩා ගනිද්දී නිර්මලා බලයට අභියෝග කරන්නීය.

"ඕවා බයට කරන තර්ජන රුක්මන්.. දේශපාලනඥයො අපේ පෑනට බයයි"
(29 වන පිට)

නිර්මලා පසක් කරගත් සත්‍යය අද පුවත්පත් කලාවේදීන් නොදකින්නේ දීන බව නිසාද සිය වෘත්තීය වගකීම් වටහා නොගත් නිසාද නැත්නම් ආත්මාර්ථකාමී බව නිසාද යන්න කල්පනා කළ යුත්තකි. ප්‍රවේශ විය හැකි වඩාත්ම නිවැරදි නිගමනය නම් අද දවසේ යථාර්ථය නිර්මාණයෙන් බොහෝ දුරට ඈත් බවය යන්නය.

නිර්මලා හීලෑ කරගනු වස් ඇමතිවරයා විසින් දෙනු ලබන ජර්මන් ශිෂ්‍යත්වය නමැති අල්ලස පවා ඇය ප්‍රතික්ෂෙප කරන්නේ ඇගේ ශක්තිය විදහාපාමිනි.

"කණගාටුයි සර්. මං හිතනවා මට පුහුණුවක් අවශ්‍ය නෑ කියලා. මොකද මම මේ රස්සාව දශක එකහමාරක් තිස්සේ කරන්නේ. ආධුනකයෝ ටිකක් යවලා පුහුණු කරානං හොඳයිනේ. ඵලදායී වෙයි. හැබැයි එකක් සර්. පත්තර කලාව කියන්නේ ඇගේ තියෙන දෙයක්. ඔබතුමාලට ඒවා තේරෙන්නෙ නැහැ"
(31 වන පිට)

සොහාන් නිර්මලාගෙන් ඈත්වන්නේ ඇගේ දඩබ්බර ගතිගුණ නිසා බවට ඉඟි අපට ලැබෙයි. තමා සම්ප්‍රදායික ගැහැනියක නොවූ බැවින් සොහාන් තමාගෙන් ඈත් වන්නට ඇතැයි නිර්මලා සිතන බව පොතේ 50 වන පිටුවේ නිර්මලා විසින් කරනු ලබන ආවර්ජනයෙන් කියැවෙයි. එසේ වුවද ඔවුන් දෙදෙනාගේ ඈත්වීමෙහි යම් ව්‍යාකූල බවක් අපට දැනෙයි.

".. නමුත් ඒ දුරස්වීම හේතුවෙන් සොහාන්ගේත් මගේත් අතර වූ සබැඳියාව බිඳකිනුදු පළුදු වූයේ නම් නැතැයි මට හැඟේ. අප ගතින් වෙන් වුවද සිතින් ලංවීමු. වඩාත් ලංවීමු."
(50 වන පිට)

නිර්මලා තර්ජන වලින් නොසැළී මත්ද්‍රව්‍ය ජාවාරම් පිටුපස හඹා යයි. ඒ අතරේ දී සොහාන් සහ තමාගේ ඈත් වීම පිළිබඳවද සිතා බලයි. ඔහු හා නැවත එක්විය යුතු යයි ඇය තීරණය කරයි. ඒ තීරණය ක්‍රියාත්මක කරන්නට පෙර ඇය යම්කිසිවකුගේ වෙඩි පහරකින් ජීවිතක්ෂයට පත්වෙයි.

නිර්මලා ගේ චරිතය උපේක්ෂා අතින් සාධාරණ ලෙස ගොඩ නැංවී ඇතැයි අපට සිතෙයි. ගෘහනියක ලෙසත් දියණියන් දෙදෙනකුගේ මවක ලෙසත් වෘත්තිය ලේඛිකාවක ලෙසත් නිර්මලා ගෙවන ජීවිතය පිළිබඳ පැහැදිළි සිත්තමක් පාඨකයා හමුවේ මවන්නට ලේඛිකාවට හැකිවී ඇත.

උපේක්ෂා සේනානායකගේ "නිර්වර්ණ" කෙටි නවකතාවේ කතා නායිකාව සංබි නම් වන්නීය. ඇය ව්‍යාවසායිකාවකි. හමුදා නිලධාරියකු වූ ඇගේ සැමියා - සමීර - මියගොස් ඇත. සංබීගේ ව්‍යාපාරික හවුල්කරුවා නඳුන් ය. නඳුන් ඇගේ හොඳම මිතුරෙකි. නඳුන් විවාහ වී සිටින්නේ මාධවී සමගය. මාධවී සමලිංගක කාන්තාවක බව කියමින් නඳුන් ඇගෙන් දික්කසාදය ඉල්ලයි.

සමීර ගේ වියෝවෙන් දුක්වන සංබී වික්ෂිප්ත කරමින් නඳුන් ඇයට සිය ආදරය ප්‍රකාශ කරයි. මුලදී ඒ ආදරය ප්‍රතික්ෂෙප කරන සංබි පසුව ඔහුට එකඟ වන්නට සිතයි. ඒ අතිශය වැදගත් නිගමනය උපේක්ෂා අපට කියන්නේ එකම එක වාක්‍යයකිනි.

"නඳුන්ගේ පරාජිත මානසිකත්වය මනාව අවබෝධකරගත් මම අවසානයේදී ඔහු සමග විවාහ වන්නට තීරණය කළෙමි"
(142 පිට)

නමුත් නඳුන් ඊර්ෂ්‍යාකාර ආදරවන්තයකු බව පසක් කරගන්නා සංබි අවසානයේ ඔහු ප්‍රතික්ෂෙප කර විදෙස් ගතවීමට තීරණය කරයි.

නිර්වර්ණ කවකතාවේ සංබි නම් වන ව්‍යාපාරික කාන්තාව සිත්තම් කිරීමේදී උපේක්ෂා සමත්කම් දැක්වුවද සමහර අවස්ථා වලදී නිර්මාණය පරයා උපේක්ෂා මතුවී පෙනීම ගැන නැවත වතාවක් සිතිය යුතුය. විශේෂයෙන් සමලිංගිකත්වය අරභයා නිර්මාණයේ ලියැවෙන අදහස් සංබිගේ නොව උපේක්ෂා ගේ යයි අපට දැනෙයි.

කතාවේ ගලා යාමට ආධාර නොවන චරිත (චන්දන රණසිංහ / අරවින්ද වැනි) වේදිකාවට පැමිණ බැස යාම ගැනද උපේක්ෂා නැවත කල්පනා කළ යුතුය.

නිර්මාණයක් යනු නිර්මාණකරුවාගේ සිතෙන් උපදින දරුවාය. ඒ දරුවා සිය පරිකල්පනයෙන් පෝෂණය කර හදා වඩා ලෝකය හමුවේ තබන්නට නිර්මාණකරුවකු හෝ නිර්මාණකාරියක හෝ දරන්නේ අපමණ වෙහෙසකි. උපේක්ෂා සේනානායක නිර්මාණ හැකියාවෙන් පිරි ලේඛිකාවක බව ඇගේ ප්‍රථම ග්‍රන්ථය අපට පෙන්වා දෙයි.

"Writing is a craft. Inspiration and the ability to dream up a story are both essential, but the creation of a good novel – or any piece of writing – requires you to use words well. The only way to hone this skill is to write frequently"

UK novelist Adrian Goldsworthy

සතත අභ්‍යාසය විසින් ඇය තව බොහෝ දුරට ගෙන යනු ලබන බව අපට විශ්වාසය.

